## ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.1,498,750,862 ක් වූ දේපල , පිරියත හා උපකරණ වටිනාකම පොත් අගය මත පදනම් වී තිබුණි. මෙම වත්කම් පිළිබඳ භෞතික පරීක්ෂණයක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමේ ක්‍රමය ඇතුළත්ව රජයේ ප්‍රදාන සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාලය විසින් හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල රු.763,843 ක් වූ පහත දැක්වෙන වගකීම් හෙළිදරව් කර නොතිබුණි.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| වේතන හා ප්‍රවාහන | 112,910 |
| පුවත්පත් වියදම | 47,990 |
| දුරකථන ඇමතුම් ගාස්තු | 603,943 |
| | 763,843 |

(ආ) රු.219,364,484 ක මුදලක් ස්ථාවර වත්කම් මුදලට මිලදී ගැනුම් ලෙස හා රු.220,300,000 ක් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් කර තිබුණද, රු.24,300,000 ක් වටිනා පරිත්‍යාග වාහනද ඉහත සඳහන් මුදලේ ඇතුළත් කර තිබුණි.

(ඇ) රු.64,345,984 ක් වූ ක්ෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.60,466,003 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.3,879,981 කින් ක්ෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සම්මන්ත්‍රණය (Symposium ) සඳහා දරන ලද පුනරාවර්තන ස්වරූපයේ රු.2,499,730 ක් වූ වියදම මූලධන වියදමක් ලෙස සාවද්‍යාව වර්ගීකරණය කර තිබුණි.

(ඉ) රු.8,000,000 ක් වූ ස්ථාවර තැන්පතු ආපසු ගැනීම්, වෙනත් ආදායමට බැරකර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.8,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති (MBA) වැඩසටහන හා බාහිර උපාධි හා වෘත්තීය ඉගැන්වීම් සඳහා මධ්‍යස්ථානය (CEDPL) විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ඒකකයන් වේ. 2012 වර්ෂයේදී මෙම ඒකකයන් විසින් පහත සඳහන් අතිරික්ත මුදල් උපයා ගෙනතිබුණි.

| | පාඨමාලා ගාස්තු | වියදම | අතිරික්තය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති (MBA) වැඩසටහන | 7,435,810 | 4,779,437 | 2,656,373 |
| බාහිර උපාධි හා වෘත්තීය ඉගැන්වීම් සඳහා මධ්‍යස්ථානය (CEDPL) | 3,434,145 | 4,714,654 | (1,280,509) |
| | 10,869,955 | 9,494,091 | 1,375,864 |

විශ්ව විද්‍යාලය විසින් 2012 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ඉහත පාඨමාලා ගාස්තු හා වියදම දක්වා නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**ආපදා ණය**

නිලධාරීන් 03 දෙනෙකුට ලබාදෙන ලද ආපදා ණය වලින් හිඟ හිටි රු.293,123 ක් දීර්ඝ කාලයක සිට අයකර නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය විස්තරය | ගිණුම්වල දැක්වෙන වටිනාකම | විගණනයට ඉදිරිපත් නොකළ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගොඩනැගිලි | 440,304,744 | තක්සේරු වාර්තාව |
| ලී බඩු | 89,549,319 | වටිනාකම දැක්වෙන සත්‍යාපන වාර්තා |
| පොත් සහ වාර සඟරා | 105,022,133 | සත්‍යාපන වාර්තා සහ උපලේඛන |
| උපකරණ | 301,314,501 | සත්‍යාපන වාර්තා |
| ආරක්ෂක තැන්පතු | 2,111,418 | සනාථ කිරීම් |
| දර්ශනවේදී / ශාස්ත්‍රපති උපාධිය | 3,278,422 | විස්තරාත්මක උපලේඛන |
| වාහන අළුත්වැඩියා | 2,309,124 | අදාළ ලියකියවිලි හෝ ලිපිගොනු |

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වු නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වු ආයතන සංග්‍රහය</u>** | |
| (i) X පරිච්ඡේදයේ 23 වගන්තිය | කථිකාචාර්යවරුන්ට ලබාදෙන ලද නිවාඩු සම්බන්ධයෙන් නිවාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | වැටුප් රහිතව ලබාගන්නා සියළුම නිවාඩු පොදු 96 ආකෘතියෙන් විගණකාධිපතිවරයාට වාර්තා කර |

| | | |
|---|---|---|
| | | නොතිබුණි. |
| | (iii) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැමිණීම හා පිටවීම සටහන් කිරීමට පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>XIX පරිච්ඡේදයේ 05 වගන්තිය | රජයේ නිල නිවාසවල පදිංචිවී සිටීම වෙනුවෙන් නිලධාරීන්ගේ වැටුප්වලින් කුලියක් අයකළ යුතු වුවද, එසේ පදිංචිව සිටි නිලධාරීන්ගේ වැටුප්වලින් කුලී අයකර ගෙන නොතිබුණි. |
| **(ඇ)** | <u>**මුදල් රෙගුලාසි**</u> | |
| | (i) 1647 (ආ) | විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම එහි වාහන සම්බන්ධයෙන් සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| | (ii) 702 (3) | කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයට අනුයුක්ත වාහන 20 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඉ) | 1998 මාර්තු 10 දිනැති අංක පීඊ/1/174/11(ආ) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව භාෂා දීමනාව රු.310,906 ක් නිලධාරීන්ට ගෙවා තිබුණි. |
| (ඊ) | 2005 ජනවාරි 31 දිනැති අංක 856 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 6.3 හා 6.4 ඡේදය | මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම්වලට අදාළව විශ්වවිද්‍යාලය විසින් කමිටුවක් පත්කර මාසික කාර්ය සාධන වාර්තා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යැවිය යුතු බවට උපදෙස්දී තිබුණි. කෙසේ වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.442,113,071 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.398,504,487 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු.367,417,850 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.74,695,221 දක්වා අඩුවී තිබුණු අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු.341,832,350 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු.56,672,137 ක් විය. ඒ අනුව රු.18,023,084 කින් මූල්‍ය ප්‍රතිඵලයේ තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

**(අ) ආදායම හා වියදම**

| විස්තරය | 2012 | 2011 | වැඩිවීම / (අඩුවීම) | වැඩිවීම / (අඩුවීම) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.(000) | රු.(000) | රු.(000) | % |
| ආදායම | 13,743 | 9,172 | 4,571 | 50 |
| වියදම | 455,856 | 407,676 | (48,180) | (12) |
| ඌනතාවය | 442,113 | 398,504 | (43,609) | (11) |
| රජයේ ප්‍රදාන | 367,418 | 341,832 | 25,586 | 07 |
| රජයේ ප්‍රදානවලින් පසු අතිරික්තය / ඌනතාවය | 74,695 | 56,672 | (18,023) | (32) |

(ආ) මූල්‍ය තත්ත්වය

| විස්තරය | 2012 | 2011 | වැඩිවීම / (අඩුවීම) | වැඩිවීම / (අඩුවීම) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.(000) | රු.(000) | රු.(000) | % |
| වෙනත් මූල්‍ය වත්කම් | 9,473 | 22,314 | (12,841) | 58 |
| වෙනත් ජංගම වත්කම් | 62,191 | 85,723 | (23,532) | (27) |
| මුදල් හා මුදල් සමාන ශේෂ | 3,330 | 390 | 2,940 | 754 |
| පර්යේෂණ ප්‍රදාන පදනම්ව අත්තිකාරම් ගෙවීම | 292 | 292 | - | 0 |
| බදු ණය හිමියෝ | - | - | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන (වැය නොකළ) | 936 | - | 936 | - |
| වෙනත් අරමුදල් | 3,284 | 2,628 | 656 | 25 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යයන් කිහිපයක විස්තර පහත දැක්වේ.

| පවත්වන ලද උපාධි පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | 2012 | 2011 |
| ව්‍යවහාර විද්‍යාව | නැත | 184 | 43 | 15 |
| කලා හා සංස්කෘතික | නැත | 118 | 179 | 02 |
| කළමනාකරණ හා වානිජ්‍යය | නැත | 274 | 106 | 01 |
| ඉස්ලාම් හා අරාබි | නැත | 243 | 88 | 04 |
| එකතුව | - | 819 | 416 | 22 |

(අ) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී උපාධි ලබාගත් මුළු සංඛ්‍යාව සියයට 1790 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ස්ථිර කථිකාචාර්යවරුන් සංඛ්‍යාව 105 ක් වු අතර එක් කථිකාචාර්යවරයකුට සිසුන් සංඛ්‍යාව 19 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී සිසුන් 776 දෙනෙකුට රු.13,531,550 ක් වු මහපොළ ශිෂ්‍යත්ව, ගෙවා තිබු අතර සිසුන් 1,096 කට රු.16,286,300 ක් වු ශිෂ්‍යාධාර ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී පිරිමි සිසුන් 505 කට හා කානතා සිසුන් 918 කට නේවාසිකගාර පහසුකම් ලබාදී තිබුණු අතර දරන ලද මුළු නේවාසිකාගාර වියදම රු.4,028,152 ක් විය.

(ඉ) ක්ෂය නොමැතිව මුළු මෙහෙයුම් වියදම රු.391,510,177 ක් වු අතර මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2034 ක් විය. සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.192,483 ක් වු අතර පසුගය වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.196,150 ක් විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉංග්‍රිසි අංශයේ කථිකාචාර්යවරයකුට එක්සත් රාජධානියේ නෝත්‍රම්බ්‍රියා ( Northunbria ) විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි අධ්‍යයනය සඳහා 2006 සැප්තැම්බර් 15 සිට 2010 ජනවාර් 10 දක්වා අධ්‍යයන නිවාඩු ලබාදී තිබුණි. ඔහුගේ අධ්‍යයන නිවාඩු සම්පුර්ණ කිරීමෙන් පසුව, වර්ෂ තුනක් ගතවීමෙන් පසුවත් සහතිකය ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් කථිකාචාර්යවරයා විසින් බැඳුම්කරය හා ගිවිසුම් කඩ කර ඇති බවට විගණනයේදී සැලකීමට සිදුවේ. බැඳුම්කර වටිනාකම රු.8,942,758 ක් විය.

(ආ) ඉන්දියාවේ මැඩ්‍රාස් (Madras ) විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි අධ්‍යයනය සඳහා II ශ්‍රේණියේ තවත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුට 2008 ජුලි 26 සිට 2009 ජුලි 25 දක්වා වර්ෂ 1 ක කාලයක් සඳහා අධ්‍යයන නිවාඩු ලබාදී තිබුණි. එහෙත් කථිකාචාර්යවරයා විසින් ඔහුගේ අධ්‍යයනය අත්හැර දමා තිබුණි. බැඳුම්කරය හා ගිවිසුම උල්ලංඝනය කිරීම හේතුවෙන් රු.1,035,321 ක් වු සම්පුර්ණ බැඳුම්කරයම ආපසු ගෙවීමට 2011 දෙසැම්බර් 13 දින පවත්වන ලද 49 වැනි නිවාඩු සහ ප්‍රදාන කමිටුව (Leave and Award Committee ) විසින්

තීරණය කර තිබුණි. කෙසේ වුවද මෙම මුදල අයකර ගැනීමට 2013 පෙබරවාරි 22 විගණන දිනය දක්වාම ඵලදායී පියවර ගෙන නොතිබුණි.

### 3.3 ව්‍යාපෘති ප්‍රමාදය

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සැලැස්ම පිළියෙල කිරීම සඳහා 2006 වර්ෂය තුළ උපදේශක සේවා ලෙස රු.16,866,550 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද එම ප්‍රධාන සැලැස්ම 2013 අප්‍රේල් 30 වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.4 අත්තිකාරම් නිරවුල් කිරීම

(අ) විශේෂිත කාරණයන් සඳහා අත්තිකාරම් ලෙස රු.88,975 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද අරමුණු කළ කාර්යයන්ට යොදා ගැනීමෙන් තොරව දීර්ඝ ප්‍රමාදයකින් පසු මෙම අත්තිකාරම් සම්පූර්ණයෙන් මුදලින් නිරවුල් කර තිබුණි.

(ආ) රු.878,100 ක් වූ අත්තිකාරම් හතරක්, ලබාගත් කාර්යය නිම කිරීමෙන් පසු සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

### 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) උපකුලපතිවරයාගේ පෞද්ගලික නිවසේ තීන්ත ආලේප කිරීමේ වැඩ සඳහා රු.118,460 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම ගෙවීම විධිමත් අනුමැතියකින් තොරව සිදුකර තිබුණි.

(ආ) උපකුලපතිවරයාගේ පෞද්ගලික නිවසේ 2012 වර්ෂයේ විදුලි බිල්පත් හා ජල බිල්පත් ලෙස රු.218,481 ක මුදලක් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

### 3.6 භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම

#### (අ) ප්‍රසම්පාදන ක්‍රමය

ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) කමිටු සටහන් වාර්තා කිරීමට ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ වෙනුවට ගොනු ගත නොකළ පත්‍රිකා ආකාරයෙන් අදාළ ප්‍රසම්පාදන ලිපිගොනුවල තබා තිබුණි. එය පසුව ලියකියවිලි හා තොරතුරු වෙනස් කිරීමට හේතුවිය හැක. මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ (ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ අංක 08 ) 2.11.3 වගන්තියේ විධිවිධාන විධිමත්ව අනුගමනය කර නොතිබුණි.

**(ආ) වානේ මේස හා පුටු මිලදී ගැනීම**

2012 පෙබරවාරි 28 දින වානේ මේස හා පුටු මිලදී ගැනීම සඳහා රු.1,257,120 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

★ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා 1998 ඔක්තෝබර් 20 දිනැති අංක 365 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

★ අතින් භාරදුන් මිල ගණන් 04 ක් පමණක් ලබාගෙන තිබුණි.

★ භාර ගැනීම් ලේඛනයේ ලියකියවිලි ලැබීම් පිළිබඳ සටහන් කර නොතිබුණ.

★ ඇගයීම් වාර්තාව හා ඇගයීම් කමිටුව සඳහා පත්වීම් ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

★ පුවත්පත්වල හා දැන්වීම් පුවරුවේ ටෙන්ඩර් දැන්වීම් ප්‍රසිද්ධ කළ යුතුය. කෙසේ වුවද මෙම ටෙන්ඩරය අවශ්‍ය පරිදි එසේ ප්‍රසිද්ධ කර නොතිබුණි.

★ ටෙන්ඩර් මණ්ඩල සටහන් අනුව, සාමාජිකයන් 03 දෙනෙකු ටෙන්ඩර් මණ්ඩලයට සහභාගී වී තිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලයට අනුයුක්ත එක් සාමාජිකයකු එදින විශ්වවිද්‍යාල රාජකාරියේ යෙදී සිට නොමැත.

★ එකතු කළ අගය මත බදු විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.8 පර්යේෂණ ප්‍රදාන**

**(අ) පර්යේෂණ දීමනා ලබාගැනීමේ පරිපාටිය**

(i) කාර්ය මණ්ඩලයේ 86 ක් පර්යේෂණ දීමනා ලබාගෙන තිබුණද, නිලධාරීන් 11 ක් පමණක් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණි.

(ii) කිසිදු යෝජනාවක් නොමැතිව කාර්ය මණ්ඩලයට පර්යේෂණ දීමනා ගෙවා තිබුණි.

(iii) 2011 හා 2012 වර්ෂ තුළ එක් පර්යේෂණ කමිටු රැස්වීමක් පවත්වා තිබුණි.
මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කළමනාකරණය විසින් පර්යේෂණ දීමනා ලබාගන්නා අධ්‍යයන කාර්ය මණ්ඩලය මගින් පර්යේෂණ කාර්යයන් කඩිනම් කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(ආ) නිරවුල් නොකළ පර්යේෂණ ප්‍රදාන**

පර්යේෂණ වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් 13 දෙනෙකුට රු.291,869 ක් වු පර්යේෂණ ප්‍රදාන ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම පර්යේෂණ ප්‍රදාන දීර්ඝ කාලයක් නිරවුල් කර නොතිබුණි.

**3.9 ගෙවීම්**

**(අ) ගරු දීමනා (Honorarium ) ගෙවීම - රු.1,111,036**

2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා බාහිර පාඨමාලා අංශය විසින් රු.1,111,036 ක් වු ගරු දීමනා ගෙවීම් 2012 ජනවාරි සිට දෙසැම්බර් කාලපරිච්ඡේදය සඳහා බාහිර උපාධි හා බාහිර පාඨමාලා ගණුමෙන් නිලධාරීන් 25 දෙනෙකුට ගෙවා තිබුණි. කෙසේ වුවද ගරු දීමනා ගෙවීම සඳහා චක්‍රලේඛ, රීති හා රෙගුලාසිවල කිසිදු විධිවිධානයක් නොවීය.

**(ආ) කුලී ගාස්තු ගෙවීම - රු.98,800**

2012 පෙබරවාරි 15 සිට මාර්තු 12 දක්වා බාහිර උපාධි විභාග කටයුතු සඳහා කුලියට ගත් වාහනයක් වෙනුවෙන් රු.98,800 ක් කුලී ගාස්තු ගෙවා තිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලයට ඇතුළුවෙන ස්ථානයේ ආරක්ෂක කාර්යාලය පවත්වා තිබුණු වාර්තා වලට අනුව ඉහත සඳහන් කුලී වාහනය එකී කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලයට ඇතුළුවු බවට සටහන් කර නොතිබුණි.

(ඇ) අයකර නොගත් විදුලි ගාස්තු

නිල නිවාස 22 ක විදුලි ගාස්තු රු.446,571 ක් විශ්වවිද්‍යාල අරමුදල් වලින් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය ප්‍රකාරව අදාළ පදිංචිකරුවන්ගෙන් විදුලි ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.10 පුස්තකාල පරිපාලනය

අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සීමාවක් නොමැතිව පොත් ලබාගෙන තිබුණු අතර, එම පොත් වර්ෂ 7 කට ආසන්න කාලයක් පුස්තකාලයට ආපසු භාරදී නොතිබුණි. සීමාවක් නොමැතිව පොත් ලබාගැනීම හා නියමිත වේලාවට එම පොත් පුස්තකාලයට ආපසු භාරදීම් සිදුනොවීම හේතුවෙන් වෙනත් සිසුන්ට හා නිලධාරීන්ට පොත් භාවිතා කිරීමේ අවස්ථා මගහැරී තිබුණි.

3.11 අධ්‍යක්ෂ හා සම්බන්ධීකාරකවරුන් පත්කිරීම

2010 ඔක්තෝබර් 25 දිනැති අංක 935 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, පාලක සභාව විසින් අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවා, පාලක සභාව විසින් පත්කරන ලද මණ්ඩලයක් මගින් බාහිර උපාධි හා බාහිර පාඨමාලා ඒකකයට අධ්‍යක්ෂක හා සම්බන්ධීකාරකවරුන් පත් කළ යුතුය. කෙසේ වුවද පාලක සභාව විසින් ඉහත රීති හා රෙගුලාසි වලට පටහැනිව අධ්‍යක්ෂ හා සම්බන්ධීකාරකවරුන් පත් කර තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

4.1 සංයුක්ත සැලැස්ම

2012- 2016 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, පාලක සභාව විසින් එය අනුමත කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක්ද සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉලක්ක ඉටුකර නොගැනීම, අතිරික්ත වියදම හා සංයුක්ත සැලැස්ම අනුව කාර්ය සාධනය, සම්පූර්ණ කර නොගැනීම සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කළ නොහැකි විය.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

## 4.5 වාර්ෂික වාර්තාව සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6 පරිච්ඡේදයේ 6.5.3 ඡේදය ප්‍රකාරව 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 4.6 අභ්‍යන්තර විගණනය

### (අ) අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය

(i) අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණ නිලධාරීන් ප්‍රමාණවත් ප්‍රමාණයක් යෙදවීම අත්‍යවශ්‍ය වේ. 2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන මහපෙන්වීම්වල 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටිය යුතු වුවද, මෙම ඒකකය සඳහා එක් නිලධාරියකු එනම් සහකාර අභ්‍යන්තර විගණක පමණක් යොදවා තිබුණි.

(ii) මුදල් පනතේ විධිවිධාන අනුව, අර්ධ වාර්ෂික විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් විශ්වවිද්‍යාලය විසින් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

# 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) අත්තිකාරම් ගෙවීම හා නිරවුල් කිරීම

(ඈ) පුස්තකාල පරිපාලනය

(ඉ) සේවක ණය

(ඊ) වෙනත් ගෙවීම්